# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## පිරිසිදු කරන්නන් භාර කණ්ඩායම් නායක [ස්ත්‍රී/පුරුෂ]

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ඔබගේ මානුෂීයභාවයත්, කරුණාවන්ත බවත් ඉතාමත් වැදගත් වේ. ඔබගේ ලිංගික, ආගමික හා දේශපාලනික අභිමතයන් පිළිබඳ නොව, ශ්‍රී ලංකාවේ සිටින අන් කිසිවෙකුටත් වඩා උසස් අන්දමින් රැකියාව කිරීමට ඔබට ඇති හැකියාව පිළිබඳ පමණක් අප සැලකිලිමත් වේ.**

පිරිසිදු කිරීම් / ජැනිටර් කණ්ඩායම් නායකයා විසින් නව තානාපති කාර්යාල පරිශ්‍රයේ සහ ගාලු පාරේ අංක 44 දරණ තානාපති කාර්යාලයට අයත් ගොඩනැගිලි පිරිසිදු කිරීම් හා භාරකාරව කටයුතු කරන ජැනිටර්වරුන් 12 දෙනෙකුට කාර්යය මඟපෙන්වීම සිදුකළ යුතු ය. එසේම මෙම තනතුර දරන්නා විසින් සියලුම තානාපති කාර්යාල ගොඩනැගිලි සම්බන්ධ සේවාවන් සඳහා වැඩමුර සකස් කර ක්‍රියාත්මක කිරීමත්, සෑම ජැනිටර්වරයෙකුටම නියමිත රාජකාරීන් සහ පිරිසිදු කිරීමේ ක්‍රියාපටිපාටීන් පැවරීමත් සිදුකළ යුතු ය. මීට අමතරව තානාපති කාර්යාලයේ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන අධීක්ෂණය කිරීම, ජැනිටර් කණ්ඩායමට අවශ්‍ය කළමණා සියල්ල ඇණවුම් කර නිකුත් කිරීම ද කළ යුතු ය.

**පූර්ණ කාලීන ව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇමෙරිකානු ඩොලර් 371.42 කි.**

කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2023 පෙබරවාරි 16 වනදා වන විට විනිමය අනුපාතය ඇ.ඩො.1 = රු. 361 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.

### සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:

■ **කොළඹ-2023-005;**

1. **අධ්‍යාපනය -** අ.පො.ස. සාමාන්‍ය පෙළ පරීක්ෂණය නිමකර තිබිය යුතු ය *(ගණිතය විෂයය ඇතුළුව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු අතර අවම වශයෙන් විෂයයන් 03ක් සඳහා විශිෂ්ට සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.)* එසේම ගෘහපාලනය පිළිබඳ මාස 03ක පුහුණු ශිල්පී මට්ටමේ ආධුනිකත්ව පුහුණු පාඨමාලවක් හදාරා තිබිය යුතු ය. (**අදාළ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.**)
2. **පූර්ව රැකියා පළපුරුද්ද -** වෘත්තීය මට්ටමේ ජැනිටර්වරයෙකු / පිරිසිදු කරන්නෙකු ලෙස අවම වශයෙන් වසර 03ක රැකියා පළපුරුද්ද තිබිය යුතු ය. **(අදාළ සේවා/ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.)**
3. **භාෂා ප්‍රවීණතාවය -** II වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
   **(මෙය පරීක්ෂා කරනු ලැබේ.)**
   III වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ/හෝ දෙමළ භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **රැකියා දැනුම -** පවිත්‍රකාරක වලින් සිදුවන රසායනික අනතුරු සහ පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ මනා දැනුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ. ස්කයි ලිෆ්ට් යන්ත්‍ර, කාඩ්බෝඩ් බේලින් යන්ත්‍ර, වැකියුම් ක්ලීනර් යන්ත්‍ර සහ ඔප දැමීමේ යන්ත්‍ර මෙහෙයවීම පිළිබඳ දැනුම තිබිය යුතු ය.
5. **නිපුණතා සහ හැකියාවන් -** පිරිසිදු කිරීමේ කාර්යයන් නියමිත වේලාවට නිම කිරීම සඳහා අවශ්‍ය මනා සන්නිවේදන හැකියාවන්, පාරිභෝගික සේවා හැකියාවන් මෙන්ම මනා නායකත්ව කුසලතා ද තිබිය යුතු ය. මනා රිය ධාවන වාර්තාවක් සහිතව **B** (පෙර **C, C1**) වර්ගයේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතු ය. **(අදාළ රියදුරු බලපත්‍රයේ දෙපැත්තෙහි ම පිටපත් අමුණා එවිය යුතු ය.)**

**හෝ**

■ **කොළඹ-2023-005S;**

1. **අධ්‍යාපනය -** ද්විතියික අධ්‍යාපනය සාර්ථක ලෙස නිම කර තිබිය යුතු ය. (ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීම සහ පිළිගත් අධ්‍යාපන ආයතනයක අවම වශයෙන් වසර 3ක් වත් පූර්ණ කාලීනව අධ්‍යාපනය හදාරා තිබීම' අනිවාර්යය වේ. (**අදාළ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.**)
2. **පූර්ව රැකියා පළපුරුද්ද -** වෘත්තීය මට්ටමේ ජැනිටර්වරයෙකු / පිරිසිදු කරන්නෙකු ලෙස අවම වශයෙන් වසර 06ක රැකියා පළපුරුද්ද තිබිය යුතු ය. **(අදාළ සේවා/ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.)**
3. **භාෂා ප්‍රවීණතාවය -** II වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
   **(මෙය පරීක්ෂා කරනු ලැබේ.)**
   III වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ/හෝ දෙමළ භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **රැකියා දැනුම -** පවිත්‍රකාරක වලින් සිදුවන රසායනික අනතුරු සහ පුද්ගලික ආරක්ෂක උපකරණ භාවිතය පිළිබඳ මනා දැනුමක් තිබීම අත්‍යාවශ්‍ය වේ. ස්කයි ලිෆ්ට් යන්ත්‍ර, කාඩ්බෝඩ් බේලින් යන්ත්‍ර, වැකියුම් ක්ලීනර් යන්ත්‍ර සහ ඔප දැමීමේ යන්ත්‍ර මෙහෙයවීම පිළිබඳ දැනුම තිබිය යුතු ය.
5. **නිපුණතා සහ හැකියාවන් -** පිරිසිදු කිරීමේ කාර්යයන් නියමිත වේලාවට නිම කිරීම සඳහා අවශ්‍ය මනා සන්නිවේදන හැකියාවන්, පාරිභෝගික සේවා හැකියාවන් මෙන්ම මනා නායකත්ව කුසලතා ද තිබිය යුතු ය. මනා රිය ධාවන වාර්තාවක් සහිතව **B** (පෙර **C, C1**) වර්ගයේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතු ය. **(අදාළ රියදුරු බලපත්‍රයේ දෙපැත්තෙහි ම පිටපත් අමුණා එවිය යුතු ය.)**

### අයදුම් කරන ආකාරය:

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරික්ෂාකාරී ව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### අවශ්‍ය ලේඛන:

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- රියදුරු බලපත්‍රය (පැති දෙකම)
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**තැපැල් හෝ ඊමේල් මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත **2023 මාර්තු** 10 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.